සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

## II පත්‍රය

## නැණ ලොවට පා නගන හපනුන්ට මග කියන
## “අදිති”

12

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 57 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**1. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

"…. නිල්වන් කඳු වළල්ල නිසොල්මනේ පසුවෙයි. එකිනෙක උස් වූ කඳු වැටි එකිනෙකට පසුපසින් මතුවී හිස ඔසවා තැනිතලාවට මුහුණලා සිටගනී. කඳු මත වූ විශාල ගල්තලාවන් මතින් ඇදහැලෙන රිදී රේඛා වැනි දියඇලි කඳුකරයේ අඳින ලද මෝස්තරයක් වැනි ය. කඳුපෙළ පාලනය කරන සෙන්පතියකු වැනි වාලිඹේ හෙළ කුඩා ළමයින් රැසක් වටකරගත් ගුරුවරයකු මෙන් ගෞරවාන්විතව නැගී සිටියි…"

(වනේ ඇඳුණු පියසටහන් - පියසේන කහඳගමගේ )

i. මෙම ඡේදයෙන් කියවෙන ස්ථානය කුමක් ද ? ........................................................................................................

ii. මෙහි නිසොල්මන් ව පසුවන්නේ කුමක් ද ? ......................................................................................................

iii. "කඳුපෙළ පාලනය කරන සෙන්පතියකු වැනි" ලෙස උපමාකර ඇත්තේ කුමක් ද ? .....................................

iv. "ඖ" ශබ්දය දෙන පිල්ලමක් සහිත මෙහි සඳහන් වචනය කුමක් ද ? ..........................................................

v. "පසුපසින් " යන පදයට විරුද්ධාර්ථ පදය ලියන්න. .........................................................................................

vi. "ළමයින් " යන පදයේ උක්ත පදය ලියන්න. ...................................................................................................

( 1 × 6 )

**2. සුදුසු ක්‍රියාපදය තෝරා ලියන්න.**

i. දෙමව්පියෝ තම දරුවන්ට සෙත් .................................. (පැතුවේ ය /පැතුවෝ ය)

ii. වෛවර්ණ පුෂ්පයෝ පරිසරය අලංකාර .................................. (කරයි /කරති)

**3. වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.**

වස්තුහාමි/ ගොවියකු වූ/ කාර්යශූර/ පුද්ගලයෙකි /ධනවත්

....................................................................................................................................................................................

**4. පහත වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

i. ඉස්සර කාලේ ගස් ගල් කතා කළ බව ................................. (පුරාන /පුරාණ) ජන කතා වලින් ප්‍රකාශ වේ.

ii. ඇතැම් ................................. (තේරවිළි /තේරවිලි) කවිවලට පිළිතුරු කවි ද ඇත.

( 1 × 5 )

**5. විරාම ලකුණු යොදා නැවත ලියන්න.**

ඒත් රජතුමනි මේක හදිසි අවස්ථාවක්

....................................................................................................................................................................................

**6.** " මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම" මෙම අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

....................................................................................................................................................................................

**7. දී ඇති වචන අතරින් මහාප්‍රාණ අකුරකින් පටන් ගන්නා වචනය තෝරා ලියන්න.**

රථය, ළමයා, ඡන්දය ........................................................................ ( 1 × 3 )

**8. යුගළ පද සම්පූර්ණ වන සේ හිස්තැන් පුරවන්න.**

ළමයි විහිළු ........................................... කරමින් කෙලි ............................................... වල නිරත වූහ. ( 1 × 2 )

**9. මෙම වැකිය බහු වචනයට හරවා නැවත ලියන්න.**

ඇය පිට්ටනිය දෙසට ගියා ය. ..............................................................................................................................

**10. මෙම වැකිය අතීත කාලයට හරවා නැවත ලියන්න.**

මිනිස්සු ණය බරින් පීඩා විඳිති. ..............................................................................................................................

**11. මෙම වැකිය උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි කර නැවත ලියන්න.**

පියුමි පරිසරයට සුවඳ බෙදති.. ..............................................................................................................................

( 1 × 3 )

**12. දී ඇති ඉංග්‍රීසි වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න.**

i. Listen to me please - ..............................................................................................................................

ii. Where do you live ? - ..............................................................................................................................

**13. පහත වාක්‍යයේ අර්ථය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

i. මා දෙස බලන්න - ..............................................................................................................................

**14. දී ඇති දෙමළ වචන හා වාක්‍යවල සිංහල අර්ථය සිංහල අකුරෙන් ලියන්න.**

i. තිරුවුංගළ් - ..............................................................................................................................

ii. එනක්කු පසික්කිරදු - .............................................................................................................. ( 1 × 5 )

**15.** මාස කිහිපයක සිට පැවැති නියඟය නිමා කරමින් වැසි සමය ඇරඹුණි. වැවු අමුණු ජලයෙන් පිරෙන්නට පටන්ගෙන ඇත. ගොවියෝ රටට බත සැපයීමේ අරමුණින් ගොවිබිම් වලට පිවිසෙති. ඔබ ද ගොවියෙකි. මේ විස්තරයට අනුව ඔබේ සිතේ ඇතිවන සිතුවිලි වාක්‍ය 3කින් ලියන්න. උක්ත ආඛ්‍යාත හා අක්ෂර වින්‍යාසය නිවැරදි වචන පහක්වත් ඇති වාක්‍ය විය යුතුය.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

( 2 × 3 )

● **නිවැරදි පිළිතුරු සපයන්න.**

**16.** පහත දැක්වෙන සංඛ්‍යාව විහිදුවා ලියන්න.

49 040 - ..........................................................................................................................................

**17.** පහත දැක්වෙන සංඛ්‍යා අවරෝහණ ක්‍රමයට පෙළගස්වා ලියන්න.

37 456, 32 598, 73 546, 23 985 ..............................................................................................

**18.** ළමයෙක් A නම් ස්ථානයේ සිට 40mක් බස්නාහිරට ගමන්කර තම දකුණු අත පැත්තට හැරී තවත් 40mක් ඉදිරියට ගමන් කර නැවත ඔහුගේ දකුණු අත පැත්තට හැරී 70mක් ඉදිරියට ගමන් කර B ස්ථානයේ නතර විය. දැන් ඔහු සිටින්නේ A ස්ථානයට කුමන දිශාවෙන් ද ? .......................................................

**19.** මගියෙක් බසයෙන් 7km ක දුරක් සහ ඉතිරි දුර දුම්රියෙන් ද ගොස් ගමන නිමා කළේ ය. ගමනේ මුළු දුර 35km ක් නම් දුම්රියෙන් ගියේ මුළු දුරෙන් කොපමණ භාගයක් ද ? .......................................................

**20.** පැණි බීම බෝතලයක 1l 50ml ක බීම ප්‍රමාණයක් ඇත. එවැනි බෝතල් 3ක ඇති මුළු බීම ප්‍රමාණය කොපමණ ද ?

.......................................................

**21.** තාත්තා 2kg 25g බර කේක් ගෙඩියක් ගෙනාවේ ය. ඉන් 1kg 50g ප්‍රමාණයක් කෑමට ගත්තේ නම් ඉතිරි කේක් ප්‍රමාණයේ බර කොපමණ ද ? .......................................................

( 2 × 6 )


**22.** රත්නපුරයෙන් පෙරවරු 10.30ට පිටත් වූ බස් රථයක් පැය 3 මිනිත්තු 47කින් මහනුවරට ළඟා විය.

i. මහනුවරට ළඟා වූ වේලාව පැය 24 ඔරලෝසු වේලාවෙන් ලියන්න. .................................................................

ii. එම වේලාව සාමාන්‍ය ඔරලෝසු වේලාවෙන් ලියන්න. .................................................................

( 2 × 2 )

**23.**




i. මෙම රූපයේ පාට කළ කොටස $\frac{2}{5}$ ක් වීමට තවත් කොටු කීයක් පාට කළ යුතු ද ? .......................................................

ii. එසේ පාට කළ පසුව ඉතිරිවන කොටු ගණන දශම සංඛ්‍යාවක් සේ ලියන්න. .................................................................

( 1 × 2 )

**24.**



i. මෙම සිලින්ඩරය දීඇති කඩ ඉරි දිගේ කපා වෙන් කරගත් පසු ලැබෙන එක් කොටසක ඇති සරල දාර ගණන කීය ද ? .......................................................................

ii. මෙහි කැපුම් මුහුණතේ හැඩය කුමක් ද ?.......................................................................

( 1 × 2 )

**25.** පහත දී ඇති බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | 1kgක මිල<br>රු. සත | මිල දී ගත් ප්‍රමාණය | වටිනාකම<br>රු. සත |
|---|---|---|---|
| සීනි | 290.00 | 2 kg | ...................................... |
| පරිප්පු | 380.00 | ...................................... | 190.00 |
| | | එකතුව | ...................................... |

( 2 × 3 )


**26.** බත් දන්සලක් සඳහා මුදල් එකතු වී තිබුණේ පිරිමි ළමයින්ගෙන් රු.4796 සහ ගැහැනු ළමයින්ගෙ රු.4265 ක් වශයෙනි. දන්සලට එකතු වූ මුළු මුදල කීයද ? ........................................................

**27.** නිවසක් සෑදීමට ගෙනා ගඩොල් ගණන 5700කි. ඉන් 2850ක් බිත්ති බැඳීමට ගෙන තිබුණේ නම් ඉතිරි ගඩොල් ගණන කීයද ? ........................................................

**28.** ගොවි මහතෙකුට තමා සතු කුඹුරේ ළියදි 15ක් තිබුණි. ඉන් ළියදි 8ක බණ්ඩක්කා ද ඉතිරි ළියදිවල වම්බටු ද සිටවූ බව කීවේ ය. වම්බටු සිටවූ ළියදි ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න. ..................................... ( 2 × 3 )

**29.** එක්තරා පාසලක පහ ශ්‍රේණියේ පන්තියක සිසුහු 35 දෙනා බැගින් සිටිති. එක් දිනයක එම පන්තිවල සිසුන්ගේ පැමිණීම පහත වගුවේ දැක්වේ. වගුව ඇසුරෙන් එදින නොපැමිණි B සහ D පන්තිවල සිසුන්ගේ තොරතුරු දැක්වෙන ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.

| පන්තිය | පැමිණි ගණන |
|---|---|
| A | 31 |
| B | 33 |
| C | 30 |
| D | 32 |




( 2 × 2 )

**30.** පළමු යකඩ කම්බියේ දිග 2m 80cmකි. දෙවන යකඩ කම්බියේ දිග 4m 60cmකි. කම්බි දෙකේම දිග සමාන වන ලෙස කපා පෑස්සිය යුතුය.

i. ඒ සඳහා දෙවන කම්බියෙන් කපාගෙන පළමු කම්බියට පෑස්සිය යුතු කොටසේ දිග කොපමණ ද ?.............

ii. එසේ පෑස්සූ පසුව එක් කම්බියක් කොපමණ දිග ද ? ........................................................................................

( 2 × 2 )

● **31 සිට 60 දක්වා ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**31.** පොදු වාහනයක ලක්ෂණයකි

(1) අපට අවශ්‍ය ස්ථානයට ම යා හැකිවීම
(2) ඕනෑම වේලාවක ගමන් කළ හැකි වීම
(3) ප්‍රවේශපත්‍රයක් ලබාගෙන පමණක් ගමන් කළ හැකි වීම

**32.** ශ්‍රී ලංකාවේ පළාත් අතරින් භූමියෙන් විශාල ම පළාත වනුයේ

(1) උතුරු මැද පළාත (2) බස්නාහිර පළාත (3) මධ්‍යම පළාත

**33.** රාත්‍රී කාලයේ පයින් ගමන් කරන්නෙකු විසින් ඇඳගෙන යා යුතු ඇඳුමේ වර්ණය

(1) කළු පාට (2) සුදු පාට (3) රතු පාට

**34.** සමබල ආහාරයකි

(1) කොත්තු රොටී (2) දියර කිරි (3) දොඩම් යුෂ

**35.** ගෙදැල්ලකරුව භාවිත වූයේ

(1) වඩු කර්මාන්තයේ දී (2) කෘෂි කර්මාන්තයේ දී (3) ධීවර කර්මාන්තයේ දී

**36.** රථ වාහනයක සංඥා ලාම්පුවේ වර්ණය වනුයේ

(1) රතු (2) කහ (3) සුදු

**37.** ජාත්‍යන්තර ක්‍රීඩා උත්සවයකි

(1) ඔලිම්පික් ක්‍රීඩා (2) සමස්තලංකා ක්‍රීඩා (3) යෞවන ක්‍රීඩා

**38.** සුළගේ වේගය මැන ගත හැකි උපකරණය

(1) සුළං ටකය (2) සුළං දිශා දර්ශකය (3) අනිලමානය

**39.** නිල් සහ කහ වර්ණයන් මිශ්‍ර වී සෑදෙන්නේ

(1) දම් පාට (2) තැඹිලි පාට (3) කොළ පාට

**40.** මේ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න

(1) ක්‍රීඩකයින්ගේ ආරක්ෂාව සඳහා උපකරණ නැත

(2) ක්‍රිකට් ජන ක්‍රීඩාවකි

(3) කජු ඇට ක්‍රීඩා කිරීමට යොදා ගනී

**41.** පෘථිවිය තමන් වටා වටයක් කරකැවීමට ගන්නා කාලය

(1) දිනයකි (2) වසරකි (3) සතියකි

**42.** පොලීසියෙන් ඉටුවන රාජකාරියකි


(1) ආදායම් බලපත්‍ර නිකුත් කිරීම

(2) ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයට අවසරපත් නිකුත් කිරීම

(3) වාහන සඳහා ආරක්ෂණ සහතික නිකුත් කිරීම

**43.** මේ අතරින් විරාමඝටිකාව තෝරන්න

(1)




(2)



(3)




**44.** මුළුතැන්ගෙයෙහි ඇති වැඩ පහසු කරගන්නා උපකරණයකි

(1) රේක්කය (2) හක්ගෙඩිය (3) වංගෙඩිය

**45.** ගෙවත්තක තිබිය යුතු අනිවාර්ය අංගයකි

(1) වැටක් (2) ළිඳක් (3) පඹයෙක්

**46.** පස සෝදායාම වැලැක්වීමට කළ හැකි දෙයකි

(1) තණකොළ වැවීම (2) පස බුරුල් කිරීම (3) ගොම පොහොර මිශ්‍ර කිරීම


**47.** ආතර් සී ක්ලාක් මහතා ප්‍රසිද්ධ වූයේ

(1) තාරකා විද්‍යාවට (2) ක්‍රීඩා ක්ෂේත්‍රයට (3) දේශපාලන ක්ෂේත්‍රයට

**48.** තවාන් දමා පැළ ලබාගන්නා බීජය

(1) බඩඉරිඟු (2) තක්කාලි (3) කුරහන්

**49.**



මෙම රූපයෙන් දැක්වෙන්නේ

(1) දරණුව (2) කුරුණිය (3) ඉදිආප්ප තට්ටුව

**50.** මේ අතරින් දෘශ්‍ය මාධ්‍යයක් නොවන්නේ

(1) රූපවාහිනිය (2) අත්පත්‍රිකාව (3) පුවත්පත

**51.** චුම්බකයකට ආර්ෂණය නොවන දෙයකි

(1) ඉදිකටුව (2) සිප්පිකටුව (3) හැට්ටකටුව

**52.** සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම්වල හතරවන පියවර වන්නේ

(1) මානසික ලිහිල්බව (2) උදානය (3) ප්‍රාර්ථනාව

**53.** බස්නාහිර පළාතට අයත් නොවන නගරය

(1) ගම්පහ (2) පස බුරුල් කිරීම (3) කළුතර

**54.** ධීවර කර්මාන්තය හා බැඳුණු වචනයකි

(1) දිද්‍රාලය (2) දියාලුව (3) දිය හොල්මන

**55.** අනාරක්ෂිත අවස්ථාවකි

(1) දුම්රිය පාරක ඇවිදීම (2) ලිස්සන සුළු පඩිපෙළක් (3) ගොම පොහොර මිශ්‍ර කිරීම

**56.** කඩොලාන ශාක බහුල ව දැකිය හැකි ප්‍රදේශයකි

(1) මුතුරාජවෙල (2) බණ්ඩාරවෙල (3) කදුරුවෙල

**57.** ප්‍රෝටීන් බහුල ශාකමය ආහාරයකි

(1) බිත්තර (2) පාන් (3) සෝයා බෝංචි

**58.** කිරි බී වැඩෙන සතුන් සපා කෑම නිසා ඇතිවන රෝගයකි.

(1) ඩෙංගු (2) ජලභීතිකාව (3) සෙංගමාලය

**59.** කිණිහිර භාවිත කරන්නේ

(1) වඩුමඩුවේ දී (2) කම්මලේ දී (3) රෝහලේ දී

**60.** මේ අතරින් ඉක්මනින් දිරාපත් වන්නේ

(1) පොලිතීන් (2) පිදුරු (3) රෙදි

( 1 × 30